1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எமது இல. / My Ref. | CSS/03/13/CIR.COM.(3) | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2026.09.24 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/SP/01/01/01/01(i) හා 2026.09.22 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින්, පහත සටහනේ දක්වා ඇති චක්‍රලේඛය, චක්‍රලේඛය නිකුත් කළ දින සිට දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2026.09.22 දාතමින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2026 | 2026.09.04 | ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ ප්‍රස්තාවනාව සංශෝධනය කිරීම |

03. ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ යටතේ පවතින අදාළ ආයතන දැනුවත් කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

රනිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2222603
කාර්යාලය / அலுவலகம் / Office 091 4119011 / 091 2234052
091 2246299
chiefsec1@sltnet.lk
www.cs.sp.gov.lk
එස්.එච්. දහනායක මාවත, ගාල්ල. S.H. Dahanayaka Mawatha, Galle. எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"ඩිජිටල් නවෝත්පාදනයෙන් ගුණාත්මක රාජ්‍ය සේවයක්"

ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
ஆளுநர் செயலகம் - தென் மாகாணம்
Governor's Secretariat - Southern Province

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Number | GS/SP/01/01/01/01(i) | ඔබේ අංකය<br>உமது இல.<br>Your Number | CSS/03/13/CIR.COM.(3) | දිනය<br>திகதி<br>Date | 2026.09. 22 |

23 SEP 2026

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

<u>පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව</u>

<u>දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මා වෙත යොමු කරන ලද ඔබේ සමාංක හා 2026.09.16 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව පහත දැක්වෙන චක්‍රලේඛය, එය නිකුත් කළ දින සිට බලාත්මක වන පරිදි දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් 2026.09.22 වැනි දින අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | චක්‍රලේඛයෙහි සඳහන් විස්තරය |
|---|---|---|
| 01 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 20/2026 – 2026.09.04 | ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ ප්‍රස්තාවනාව සංශෝධනය කිරීම |

03. ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද ඉහත චක්‍රලේඛයෙහි පිටපතක් මේ සමග අමුණා ඔබ වෙත කාරුණිකව ඉදිරිපත් කරමි.

කේ.පී.එස්.දමයන්ති
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

260922-1

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 20/2026

මගේ අංකය : EST-1/RESCH/08/0019
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2026.09.04

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ ප්‍රස්තාවනාව සංශෝධනය කිරීම

ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ ප්‍රස්තාවනාව කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. 2026 අගෝස්තු මස 10 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය පරිදි ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ ප්‍රස්තාවනාවේ 3 වගන්තියට ඉනික්බිතිව 4 ලෙස නව වගන්තියක් ඇතුළත් කර සංශෝධනය කෙරේ.

> "4. ආයතන සංග්‍රහයේ කිසිදු විධිවිධානයක්, පාර්ලිමේන්තු පනතකින් නිලධාරියෙකුට ප්‍රදානය කර ඇති ඕනෑම අයිතියක්, වරප්‍රසාදයක් හෝ මුක්තියක් කිසිදු ආකාරයකින් ප්‍රතික්ෂේප කිරීමක් හෝ සීමා කිරීමක් ලෙස අර්ථකථනය නොකළ යුතු ය."

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-662340
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ad-1-est@pubad.gov.lk

ඉහත රාජ්‍ය පරිපාලන ..20/2026... චක්‍රලේඛය, 2026/9/04 දින ... පළාත්සභාවට අදාළ කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය 2026/9/22 දින ලබා දී ඇති බව සහතික කරමි.

26/09/22
ආණ්ඩුකාර ලේකම්/ ... ලේකම්/ ...

ජේ.පී.එස්.දමයන්ති
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත